හම්බන්තොට අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2014

ගණිතය I **8 ශ්‍රේණිය.........**

නම .... **මිනිත්තු 45 යි**

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න
(1- 20 ප්‍රශ්න සඳහා ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලකුණු 40 ක් පිරිනැමේ.)

I කොටස

01 පාද වල දිග $12cm$, $10cm$, $8cm$ වු ත්‍රිකෝණයක පරිමිතිය සොයන්න.

02 $(-5) + (+2)$ හි අගය සොයන්න.

03 55^0 අනුපූරක කෝණයේ අගය කීය ද?

04 $5x + 20$ හි සාධක සොයන්න.

05 7.5×0.5 සුළු කරන්න.

06 60% භාගයක් ලෙස ලියා සුළු කර දක්වන්න.

07 $2x + 5 = 11$ නම් x හි අගය සොයන්න.

08 x හි අගය සොයන්න.



09 $\frac{\square}{(-6)} = (-4)$ නම් හිස්තැනට සුදුසු අගය ලියන්න.

10 ද්වාදසතලයක (i) මුහුණතක හැඩය කුමක් ද?

(ii) එහි මුහුණත් කීයක් තිබේ ද?

11 $5000kg$ මෙට්‍රික් ටොන් වලින් දක්වන්න.

12 $x = 2$ නම් $x(x + 1)$ හි අගය කීය ද?

13 බද්ධ කෝණ යුගලයක තිබිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න.

14 400 හි වර්ගමූලය සොයන්න.

15 A : B = = 3 : 5 හා A : C = 2 : 3 නම් A : B : C අගය සොයන්න.

16 ත්‍රිකෝණයක බාහිර කෝණ වල ඓක්‍යය 180^0 කි. එම ප්‍රකාශය සත්‍ය හෝ අසත්‍ය බව හේතු සහිත ව පැහැදිලි කරන්න.

17 $(-1)^{15}$ හි අගය සොයන්න.

18 සමචතුරස්‍රයක භ්‍රමක සමමිති ගනය කීය ද?

19 ත්‍රිකෝණ කුලකයේ අවයව සියල්ල ලියා දක්වන්න.

20 $3(x + y) + 2x$ සුළු කර දක්වන්න.

හම්බන්තොට අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2014

ගණිතය II **8 ශ්‍රේණිය ……**

නම ………………………………………………… **පැය 1 මිනිත්තු 30**

* පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

* පළමුවන ප්‍රශ්නයට ලකුණු 16 ක් ද ඉතිරි ප්‍රශ්න වලට ලකුණු 11 බැගින් ද හිමි වේ.

II කොටස

01 පළමු වාරයේ දී ඔබ සම්පූර්ණ කරන ලද සංඛ්‍යා ප්‍රහේලිකාව පිළිබඳ ක්‍රියාකාරකම සිහියට නගන්න.

i ප්‍රහේලිකාව සඳහා භාවිතයට ගන්නා ලද විෂය කොටස් මොනවා ද? **ලකුණු 03**

ii ප්‍රහේලිකාව පිටපත් කරගෙන දී ඇති රුකුල් පද අනුව එය සම්පූර්ණ කරන්න.

iii <u>පහලට</u>

H $\rightarrow$ $a = 5, b = 3, n = 2$ නම් $(ab)^n$ හි අගය

K $\rightarrow$ 4884 ÷ $\square\square\square$ = 22 නම් හිස්තැනට ගැලපෙන අගය

I $\rightarrow$ 50 න් හරි අඩක්වන සංඛ්‍යාවට 1ක් අඩු සංඛ්‍යාව

<u>හරහට</u>

H $\rightarrow$ පස්වන සමචතුරස්‍ර සංඛ්‍යාව

L $\rightarrow$ $(-3)^4 + (-2)^3 + 2$ හි අගය

K $\rightarrow$ $x = 4, 2x = y, 3x = z$ නම් $(x + y + z)$ හි අගය **ලකුණු 13**

M $\rightarrow$ තුන්වන ප්‍රථමක සංඛ්‍යාවේ තුන්වන බලය (වගුවට හා හිස්කොටු වලට 1 බැගින්)



02 පුද්ගලයෙකුගේ මාසික වැටුප රු. 25 000 කි. ඉන් 40% ක් ආහාර සඳහා ද 20% ක් ඇඳුම් සඳහා ද වියදම් කරයි.

i වෙනත් වියදම් සඳහා ඉතිරි වන මුදලේ ප්‍රතිශතය කොපමණ ද? **ලකුණු 02**

ii ආහාර සඳහා වියදම් කරන මුදල කොපමණ ද? **ලකුණු 03**

iii ඇඳුම් සඳහා යන වියදම් වන මුදල කොපමණ ද? **ලකුණු 03**

iv දරුවන්ගේ ඉගෙනීමේ කටයුතු සඳහා රු. 2500 ක් වියදම් කරයි නම්, එම මුදල වැටුපේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න. **ලකුණු 03**

03 පහත සඳහන් භාග සුළු කර සරල ම ආකාරයෙන් ලියන්න.

i $\frac{3}{4} + \frac{1}{4}$ **ලකුණු 02**

ii $\frac{3}{4} + \frac{1}{6} - \frac{2}{3}$ **ලකුණු 03**

iii $1\frac{1}{2} \times 2\frac{2}{3} \times 1\frac{1}{5}$ **ලකුණු 03**

iv $2\frac{3}{4} \div 1\frac{1}{2}$ **ලකුණු 03**

04 සංඛ්‍යා අනුක්‍රමයක පොදු පදය $\frac{n(n+1)}{2}$ වේ.

i මුල් පද පහ ලියන්න. **ලකුණු 05**

ii මෙම අනුක්‍රමයෙන් දැක්වෙන සංඛ්‍යාව රටාව කුමක් ද? **ලකුණු 02**

iii ඔත්තේ සංඛ්‍යා රටාවේ පොදු පදය ලියන්න. **ලකුණු 02**

iv 29 කී වැනි ඔත්තේ සංඛ්‍යාව ද? **ලකුණු 02**

05 මෙම රූපයේ



i සමද්විපාද ත්‍රිකෝණයක් නම් කරන්න. **ලකුණු 02**

ii x^0 හි අගය සොයන්න. **ලකුණු 02**

iii b^0 හි අගය කොපමණ ද? **ලකුණු 02**

iv a^0 හි අගය සොයන්න. **ලකුණු 02**

v PQS ත්‍රිකෝණයේ අභ්‍යන්තර කෝණ වල අගයන් ලියන්න. **ලකුණු 03**

06 (a) එක්තරා නිවසක මාසයක් තුළ විදුලි ඒකක x සංඛ්‍යාවක් භාවිතා කර තිබින.

i විදුලි ඒකකයක් සඳහා ගාස්තුව රු 8 ක් නම්, ඒකක x සඳහා වැයවන මුදල x ඇසුරෙන් සොයන්න. **ලකුණු 02**

ii මාසික ව රුපියල් 80 ක ස්ථාවර ගාස්තුවක් අය කෙරේ නම්, විදුලිය සඳහා වැයවන මුදල විජීය ප්‍රකාශනයකින් දක්වන්න. **ලකුණු 02**

iii මාසික විදුලි ඒකක ගණන 50 ක් නම්, එම මාසයේ ගෙවිය යුතු මුදල කොපමණ ද? **ලකුණු 03**

(b) i

	t	*kg*
	5	2 9 5
+	2	9 2 1

ii

	t	*kg*
	1 4	3 8 5
-	7	5 0 2

ලකුණු 04